ඇමුණුම I

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ

අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත් කිරීම සඳහා

අයදුම්පත් කැඳවීමේ නිවේදනය

මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරේ පුරප්පාඩු 02ක් පවතින අතර එම පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත අනුව සකස් කරන ලද අයදුම්පත් 2019.04.30 දිනට පෙර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු වේ.

I. තනතුරට පත් කිරීමේ ක්‍රමය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාව විසින් අනුමත පහත දක්වා ඇති ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

II. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ පිළිවෙළ පහත දක්වා ඇත.

ලකුණු පටිපාටිය

| | ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 1. | සේවා පළපුරුද්ද | | 60 |
| | I. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක එක් වසරක සේවා කාලයකට ලකුණු 5 බැගින් උපරිම වසර 10ක් සඳහා (වසරකට අඩු මාස 06ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සඳහා ලකුණු 2 ½ක් ලබා දෙන අතර ඊට වඩා අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.) | 50 | |
| | II. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තුල ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ I ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක එක් වසරක සේවා කාලයකට ලකුණු 2 බැගින් උපරිම වසර 05ක් සඳහා (වසරකට අඩු මාස 06ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සඳහා ලකුණු 1ක් ලබා දෙන අතර ඊට වඩා අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.) | 10 | |
| | කුසලතාවය | | 40 |
| | I. අධ්‍යාපන සුදුසුකම්<br>ආචාර්ය උපාධිය - 15<br>පශ්චාත් උපාධිය - 10<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - 05<br>(උපරිම සුදුසුකම් එකකට පමණක් ලකුණු ලබා දේ.) | 15 | |

| | | | |
|---|---|---|---|
| | II. වෘත්තීය සුදුසුකම්<br>(අ) ( i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - **10**<br>(දේශීය/ විදේශීය)<br><br>(ii) එම ක්ෂේත්‍රයේ මාස 06 ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා - 05<br><br>(ආ) ආයතනය විසින් තීරණය කරන තනතුරට අදාල ක්ෂේත්‍රයේ සම්පූර්ණ කරන ලද අන්තර්ජාතිකව පිළිගත් වෘත්තීය සහතික **(Professional Qualifications)** සඳහා කාල සීමාව නොසලකා ඉහත 2 (II) (අ) (i) යටතේ සැලකීමට ලක් කෙරේ.<br><br>උදා :-1) **BCS/ ACS**<br>2) **Microsoft Certifications**<br>3) **Sun Certifications**<br>4) **Cisco Certifications**<br>5) **CISSP Certifications etc.** | 10 | |
| | **III.** විශේෂ කාර්යන්/ දායකත්වයන්<br>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාලව සිදු කරන ලද නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>(අ) නව නිර්මාණ, වැඩි දියුණු කිරීම්, ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 05ක් සඳහා ලකුණු 10<br><br>(ආ) පොදු 230b ආකෘතියෙන් ඉදිරිපත් කර අමාත්‍යාංශ ලේකම් /ආයතන ප්‍රධානියා විසින් සහතික කළ ප්‍රශංසා එකක් සඳහා ලකුණු 1 බැගින් උපරිම ප්‍රශංසා 5ක් සඳහා පමණක් එනම් උපරිම ලකුණු 5ක් පමණක් ලබා දෙනු ලබන අතර අයදුම්කරුවෙකුට ප්‍රශංසා සඳහා උපරිම ලකුණු 5ක් ලබා ගැනීමෙන් පසු ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා මෙම සුදුසුකම යටතේ ලබා දෙන ඉතිරි ලකුණු 05ක් ද ලබා ගත හැකිය.<br><br>ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා උදාහරණ :<br><br>1)මෘදුකාංග නිර්මාණය/ සංවර්ධනය **(Software Designing/ Development)**<br>2)ජාල පරිපාලනය **(Network Administration)**<br>3)පද්ධති පරිපාලනය **(System Administration)**<br>4)දත්ත පාදම පරිපාලනය **(Database Administration)**<br>5)සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සහ වෙනත් **(General ICT Tasks &etc.)**<br>සැ.යු.<br>❖ නව නිර්මාණ, වැඩි දියුණු කිරීම් අයදුම්කරු විසින්ම සිදු කළ බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය. | 10 | |

| | | | |
|---|---|---|---|
| | ❖ ත්‍යාග හා ජයග්‍රහණ අයදුම්කරු විසින් ලබා ගත් බවට විධිමත් සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. | | |
| | IV. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය<br>සන්නිවේදන කුසලතාවය - 02<br>නායකත්වය - 02<br>පෞරුෂත්වය - 01 | 05 | |
| | සැ.යු.<br><br>I. සියලු පාඨමාලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ රජය විසින් පිළිගත් ආයතනයක් මඟින් ලබා දෙන පාඨමාලා විය යුතු යි.<br><br>II. බඳවා ගැනීමකදී, කාර්යක්ෂමතා කඩඉම් සඳහා සහ වෙනත් දෙපාර්මේන්තු පරීක්ෂණ සඳහා අදාල කර ගත් සුදුසුකම් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.<br><br>III. ඩිප්ලෝමා පාඨමාලාවක් වසර 01ක් හෝ පැය 1500ක් විය යුතු ය. | | |

III. ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය

මෙම නිවේදනය සමඟ ඉදිරිපත් කර ඇති ආදර්ශ ඉල්ලුම්පත අනුව සකසන ලද ඉල්ලුම්පත් ඉහත 02 ඡේදයේ දක්වා ඇති දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත භාර දිය යුතු ය. අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුර සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ලේකම්,
ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශය

[illegible]
ලේකම්
ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යාංශය